# සී/ස ගඟ ඉහළ කෝරළේ විවිධ සේවා සමුපකාර සමිතිය
# කුරුඳුවත්ත කඩවීදිය

# තනතුරු පුරප්පාඩු

සී/ස ගඟ ඉහළ කෝරළේ විවිධ සේවා සමුපකාර සමිතියේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුර සඳහා මධ්‍යම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ 07/2025 චක්‍රලේඛය අනුව සුදුසුකම් සපුරන මධ්‍යම පළාතේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. සියලුම අයදුම්පත් 2025.11.08 දින මධ්‍යහන 12.00 ට හෝ එදිනට පෙර **"ගරු සභාපති, සී/ස ගඟ ඉහළ කෝරළේ විවිධ සේවා සමුපකාර සමිතිය - කුරුඳුවත්ත කඩවීදිය"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාරදිය හැකිය. අයදුම්පත් එවීමේදී ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන්කර එවිය යුතුය.

සමිතිය විසින් පිළියෙලකර ඇති අයදුම්පත් රු. 500/- ක මුදලක් ගෙවා රාජකාරී වේලාව තුළ සමිති ප්‍රධාන කාර්යාලයෙන් ලබාගත හැකි අතර, සමිතියෙන් නිකුත් කරන ලද අයදුම්පත් පමණක් වලංගුවේ. අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් එවිය යුතුය.

- උප්පැන්න සහතිකය
- ජාතික හැඳුනුම්පත
- පදිංචිය සනාථ කරන ග්‍රාම නිලධාරී සහතිකය
- චරිත සහතික 02 ක්
- අධ්‍යාපන සහතික

**01. තනතුර : සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්) III**

**පුරප්පාඩු සංඛ්‍යාව - 01**

වැටුප් පරිමාණ අංකය : E:L - 02 : 01

වැටුප් පරිමාණය : 39200 - 635 x 10 - 955 x 10 - 1,270 x 10 = 67,800/-

(ඉහත වැටුපට අමතරව සමුපකාර සේවක කොමිෂන් සභාවෙන් අනුමත දීමනාවන් ලබාදෙන අතර සේවක විශ්‍රාම වැටුප් හිමිකම්ද ඔබට හිමිවේ)

වයස් සීමාව : 18 – 45

(සමුපකාර සේවයේ නියුතු අයට ඉහත වයස් සීමාව බලපානු නොලැබේ)

**සුදුසුකම් :**

අ. අභ්‍යන්තර විගණක තනතුරක වසර 04 ක ස්ථිර සේවා පළපුරුද්දක් / ග්‍රාමීය බැංකු අභ්‍යන්තර විගණක තනතුරක වසර 05 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම / පොත් තබන්නා තනතුරක වසර 06 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම / ග්‍රාමීය බැංකු කළමනාකරු තනතුරක වසර 06 ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම

හෝ

ආ. පිළිගත් ආයතනයක ගණකාධිකරණ / බැංකු හා මූල්‍ය කළමනාකරණය පිළිබඳ මාස 09 කට නොඅඩු අධ්‍යයන කාලයක් සහිත ඩිප්ලෝමාවක් සමත්වීම සමග අභ්‍යන්තර විගණක තනතුරක වසර 02 ක / ග්‍රාමීය බැංකු අභ්‍යන්තර විගණක තනතුරක වසර 03 ක ස්ථිර සේවා පළපුරුද්දක් / පොත් තබන්නා තනතුරක වසර 03 ක ස්ථිර සේවා පළපුරුද්දක් / කළමනාකරු (ව්‍යාපෘති) තනතුරක වසර 03 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම / ග්‍රාමීය බැංකු කළමනාකරු තනතුරක වසර 03 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම / ගිණුම් සහකාර 1 තනතුරක වසර 06 ක සේවා පළපුරුද්දක් තිබීම

හෝ

ඇ. පිළිගත් විශ්වවිද්‍යාලයක / පිළිගත් ආයතනයක ගණකාධිකරණ / වාණිජ / කළමනාකරණය පිළිබඳ උපාධියක් සමත්වී තිබීම / උසස් තාක්ෂණ ආයතනයේ ගණකාධිකරණය / ව්‍යාපාර පරිපාලනය යන ඩිප්ලෝමාවන්ට අදාළව වසර 2 1/2 ක පාඨමාලාවක් සමත්වී තිබීම

හෝ

ඈ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අදියර I (Charted Level 1) / ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ අදියර III (A.A.T. Level III) සමත්වීම.

**සභාපති,**
**සී/ස ගඟ ඉහළ කෝරළේ විවිධ සේවා සමුපකාර සමිතිය,**
**කුරුඳුවත්ත කඩවීදිය.**
**2025.10.13**